රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 10/89

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1989 පෙබරවාරි මස 09 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**අතුරු පියවරක් වශයෙන් රජයේ නිලධාරීන් මධ්‍යම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල සිට පළාත් සභාවලට මුදා හැරීම**

පළාත් සභා ක්‍රියාත්මක කිරීමට හැකිවන අයුරු, අතුරු පියවරක් වශයෙන් මධ්‍යම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන් ඒ ඒ පළාත් සභාවල කටයුතු කිරීම සඳහා මුදාහැරීමට රජය තීරණය කොට ඇත. ඒ අනුව පවරනු ලබන රාජකාරි ඉටුකිරීම සඳහා ඒ ඒ පළාත් සභාවලට අවශ්‍ය කාර්ය මණ්ඩල අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලින් මුදාහරින මෙන් ඔබගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

02. සේවය අවශ්‍ය වන්නේ කිනම් නිලධරයන්ගේද යන්න හඳුනා ගැනීමෙන් පසු ඒ ඒ පළාත් සභාවලට අවශ්‍ය නිලධරයන්ගේ නම් හා තනතුරු එක් එක් පළාත් සභාවක ප්‍රධාන ලේකම් විසින් ඔබට දැනුම් දෙනු ඇත. ඒකාබද්ධ සේවාවේ නිලධරයන් සම්බන්ධයෙන් (මාණ්ඩලික හා මාණ්ඩලික නොවන ශ්‍රේණි) ප්‍රධාන ලේකම් විසින් මෙම අමාත්‍යාංශය අමතනු ඇත.

03. අතුරු කාලසීමාව තුළ පළාත් සභාවලට මුදාහරිනු ලබන නිලධාරීන්ගේ නියමයන් හා කොන්දේසි වෙනස් නොවී පවතිනු ඇත. ඔවුන් මධ්‍යම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල සිටියදී දැරූ තනතුරු වලට අදාල වූ නියමයන් හා කොන්දේසිම තබාගනු ඇත. පළාත් සභාවලට අවශ්‍ය ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ නම් සහ තනතුරු විස්තර ලැබූ වහාම එක් සෑම නිලධාරියකුටම මෙහි අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය පරිදි මුදාහැරීමේ ලිපියක් නිකුත් කිරීමට පියවර ගනු මැනවි.

04. ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නිලධරයකු පළාත් සභාවකට මුදා හැරීමේදී පැන නගින කුමන හෝ දුෂ්කරතාවයක් හෝ ගැටළුවක් වුවහොත් නොවළහා මා වෙත දැන්විය යුතුය.

(සිරිල් ගමගේ)
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

එන්/-

..............................

මහතා/මහත්මිය/මෙනවිය.

..........................

(තනතුර)

..............................

## පළාත් සභාවේ සේවය සඳහා මුදාහැරීම.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක ..........10/89..........යටතේ ......

.................... දින සිට ඔබ නැවත දන්වන තෙක් ..............
පළාත් සභාවේ ....................................කටයුතු කිරීම
සඳහා මුදාහැර ඇති බව සතුටින් දන්වමි.

02. ..........................පළාත් සභාවේ ....................
ඔබ සේවයේ යෙදී සිටින කාලසීමාව තුළ ඔබගේ මුල් පත්වීම හා අදාල වූ නියමයන් හා කොන්දේසි වෙනස් නොවී බලපවත්වනු ඇත.

03. කාරුණිකව මෙය ලැබුණු බව දන්වන්න.

............

අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා

පිටපත:- ප්‍රධාන ලේකම්,

..........................පළාත් සභාව.